එරික් සොල්හයිම්: විධායක අධ්‍යක්ෂක ද? හිටපු විධායක අධ්‍යක්ෂක ද?

ශ්‍රී ලංකා ජනපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ජාත්‍යන්තර දේශගුණ උපදේශක තනතුරට එරික් සොල්හයිම් පත් වීම, මාධ්‍ය තුළ අවධානය ලබාගන්නට සමත් වූ පුවතක් විණි.

කෙසේ නමුත්, මේ පිළිබඳ වාර්තා කිරීමේදී ඇතැම් දේශීය පුවත්පත් එරික් සොල්හයිම් එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ විධායක අධ්‍යක්ෂවරයා බව සඳහන් කළ අතර, තවත් පුවත්පතක් සඳහන් කර තිබුණේ, එරික් සොල්හයිම් යනු එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ හිටපු විධායක අධ්‍යක්ෂවරයා බවයි.

කෙසේ නමුත්, එරික් සොල්හයිම් එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ හිටපු විධායක අධ්‍යක්ෂවරයා බව විදෙස් මාධ්‍ය සහ නිල මූලාශ්‍ර තුළ සඳහන්ව තිබේ.

එසේ නම්, වඩාත් නිවැරදි යැයි ඔබ තෝරාගන්නා පුවත කුමක්ද?

මූලාශ්‍ර:
https://www.theguardian.com/.../un-environment-chief-erik...
https://www.unep.org/people/erik-solheim